# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සුරාබදු (සංශෝධන)

**(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2018 ජූලි මස 19 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 ජූනි මස 22 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[260 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 30 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ උපකරණ තබා ගැනීම සඳහා නියම කර ඇති තැනැත්තන් කාණ්ඩ පුළුල් කිරීම ය.

***3 වන වගන්තිය*** : මෙම වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බදු අයකළ හැකි ද්‍රව්‍ය මත අය කරනු ලබන බදුවලින් සිදුවිය හැකි යම් ආදායම් අහිමිවීම ඉවත් කිරීමේ අරමුණින් යුතු ව, බදු අයකළ හැකි ද්‍රව්‍ය මත ඇලවිය යුතු ආරක්ෂිත සලකුණු නිකුත් කිරීම සහ එම ආරක්ෂිත සලකුණු සැපයීම සඳහා ගාස්තු අය කිරීම පිණිස රීති සෑදීමේ බලය අමාත්‍යවරයා වෙත ලබා දීම ය.

# සුරාබදු (සංශෝධන)

එල්. ඩී.— ඕ. 21/2018.

**(52 වන අධිකාරය වූ ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක දරන සුරාබදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(52 වන අධිකාරය වූ සුරාබදු ආඥාපනතේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) (1) වන උපවගන්තියේ "බලපත්‍රයක් යටතේ බදු අයකළ හැකි ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන හෝ විකුණන සෑම තැනැත්තකුම" යන වචන වෙනුවට "බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ පාස් පතක් යටතේ යම් බදු අයකළ හැකි ද්‍රව්‍යයක් ආනයනය කරන, අපනයනය කරන, ප්‍රවාහනය කරන, නිෂ්පාදනය කරන, විකුණන, සන්තකයේ දරන හෝ ගබඩාකර තබන සෑම තැනැත්තකුම" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ පැති සටහනේ "ඇතැම් බලපත්‍රලාභීන්"යන වචන වෙනුවට "බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ පාස් පතක් දරන්නා"යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඒඅ) යම් බදු අයකළ හැකි ද්‍රව්‍යයක් ආනයනය කිරීමේ දී, අපනයනය කිරීමේ දී, ප්‍රවාහනය කිරීමේ දී, නිෂ්පාදනය කිරීමේ දී, විකිණීමේ දී, සන්තකය දරා සිටීමේ දී හෝ ගබඩා කිරීමේ දී එම බදු අයකළ හැකි ද්‍රව්‍යයක් මත ඇලවිය යුතු ආරක්ෂිත සලකුණුවල ස්වභාවය නියම කිරීම;

(ඒආ) යම් බදු අයකළ හැකි ද්‍රව්‍යයක් ආනයනය කිරීමේ දී, අපනයනය කිරීමේ දී, ප්‍රවාහනය කිරීමේ දී, නිෂ්පාදනය කිරීමේ දී, විකිණීමේ දී, සන්තකය දරා සිටීමේ දී හෝ

ගබඩා කිරීමේ දී එම බදු අයකළ හැකි ද්‍රව්‍ය මත ඇලවිය යුතු (ඒඅ) ඡේදයේ සඳහන් කරන ලද ආරක්ෂිත සලකුණු නිකුත් කිරීම සඳහා ගාස්තු අය කිරීම;”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.